# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2026 අප්‍රේල් මස 17 වන දින

## II වන කොටස

## අතිරේකය

(2026.04.23 දින නිකුත් කරන ලදී)

# විදුලිසංදේශ බදු (සංශෝධන)

**2011 අංක 21 දරන විදුලිසංදේශ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 29.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2011 අංක 21 දරන විදුලිසංදේශ බදු පනතේ 2 වන වගන්තිය ඉවත් කරනු ලබන අතර, එහි නීතිය බලපෑම වනුයේ-

(අ) ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන අදාළ වීම විදුලිසංදේශ සේවා සැපයුම්කරුවකු දක්වා දීර්ඝ කිරීම; සහ

(ආ) විදුලිසංදේශ සේවා ග්‍රහණය කරනු ලබන තැනැත්තන්ගෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාවන්ට අදාළව අයකරගත යුතු විදුලිසංදේශ බදු අනුප්‍රමාණ නිශ්චිතව දැක්වීම,

වේ;

***3 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ යම් කාලසීමාවක් තුළ ශ්‍රී ලංකා විදුලිසංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ගෙවිය යුතු බදු මුදල් ප්‍රමාණයෙන් යම් බොල් ණයක් අඩු කිරීම සඳහා විදුලිසංදේශ සේවා ක්‍රියාකරුවන්ට සහ සැපයුම්කරුවන්ට හැකි කරවීම වේ.

***4 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගිකව වේ.

***5 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගිකව වේ.

***6 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ''සැපයුම්කරු'' යන යෙදුම අර්ථනිරූපණය කිරීම මගින් ඒ වගන්තියට අලුත් අර්ථනිරූපණයක් හඳුන්වාදීම වන අතර එය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගිකව වේ.

***7 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට උපලේඛනයක් ඇතුළත් කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගිකව වේ.

එල්.ඩී.-ඕ. 74/2025

## 2011 අංක 21 දරන විදුලිසංදේශ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2026 අංක  දරන විදුලිසංදේශ බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2011 අංක 21 දරන පනතේ 2 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2011 අංක 21 දරන විදුලිසංදේශ බදු පනතේ 2 වන වගන්තිය මෙයින් ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"විදුලිසංදේශ බද්ද පැනවීම

**2.** යම් විදුලිසංදේශ සේවාවක් ග්‍රහණය කරනු ලබන සෑම තැනැත්තකුගෙන් ම එක් එක් මාසය සම්බන්ධයෙන් විදුලි සංදේශ සේවා ලැබීමේ දී යම් ක්‍රියාකරුවකු හෝ සැපයුම්කරුවකු විසින් සපයන ලද පරිදි වූ විදුලිසංදේශ සේවා සැපයුමේ අගය මත මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරන ලද අනුප්‍රමාණයක් මත (මෙහි මින්මතු "බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) විදුලිසංදේශ බද්ද යනුවෙන් හඳුන්වනු ලබන බද්දක් පනවා අයකරගනු ලැබිය යුතු ය:

එසේ වුව ද, 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ විධිවිධාන අදාළ වන කිසිදු සංවිධානයක් හෝ පුද්ගලයකු විසින් ඉහත සඳහන් බද්ද ගෙවීම අවශ්‍ය නොවන්නේ ය.".

PL 15731 - 465(2026/04)

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තිය එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්;

(2) එකී නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියේ, "1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලිසංදේශ පනතේ 17 වන වගන්තිය යටතේ බලපත්‍රලත් ක්‍රියාකරුවන් විසින් එකතු කර, (මෙහි මින්මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා විදුලිසංදේශ නියාමන කොමිෂන් සභාව විසින්" යන වචන සහ අංක වෙනුවට පහත දැක්වෙන වචන සහ අංක ආදේශ කිරීමෙන්:-

"ක්‍රියාකරුවන් හෝ සැපයුම්කරුවන් විසින් එකතු කර, (මෙහි මින්මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලිසංදේශ පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා විදුලිසංදේශ නියාමන කොමිෂන් සභාව විසින්,"; සහ

(3) එහි නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ලෙස අංකනය කරනු ලැබිය යුතු පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(2) මේ (සංශෝධනය) පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින හෝ ඊට පසුව ආරම්භ වන කාල සීමාවක් සඳහා (1) වන උපවගන්තිය යටතේ ක්‍රියාකරුවකු හෝ සැපයුම්කරුවකු විසින් කොමිෂන් සභාව වෙත ගෙවිය යුතු බදු ප්‍රමාණය නිශ්චය කිරීමේ දී, ඒ

කාලසීමාව තුළ බොල් ණයක් බවට පත්ව ඇති, එකී ක්‍රියාකරු හෝ සැපයුම්කරු විසින් උපචිත කර ගනු ලැබ ඇති එකී බොල් ණයට සමාන මුදල් ප්‍රමාණයක් පෙර කාලසීමාවක දී කොමිෂන් සභාව වෙත ගෙවන ලද බදු ප්‍රමාණයක් වශයෙන් අඩු කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ උපවගන්තිය යටතේ කලින් අඩු කරන ලද මුදල් ප්‍රමාණයක් වෙනුවෙන් ඒ ක්‍රියාකරු හෝ සැපයුම්කරු විසින් යම් කාලසීමාවක දී එකතු කරන ලද යම් මුදලක්, ඒ මුදල එකතු කරන ලද කාල සීමාව සඳහා කොමිෂන් සභාව වෙත ගෙවන ලද මුදල් ප්‍රමාණයට ඇතුළත් විය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය, ඒ වගන්තියේ ''ක්‍රියාකරුවකු'' යන වචනය යෙදෙන ඕනෑම අවස්ථාවක, ඒ වෙනුවට ''ක්‍රියාකරුවකු හෝ සැපයුම්කරුවකු'' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය, ඒ වගන්තියේ ''ක්‍රියාකරුවකු'' යන වචනය යෙදෙන ඕනෑම අවස්ථාවක, ඒ වෙනුවට ''ක්‍රියාකරුවකු හෝ සැපයුම්කරුවකු'' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ''විදුලි සංදේශ සේවාව'' යන යෙදුමේ අර්ථ නිරූපණයේ ''1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය යටතේ බලපත්‍ර ලැබූ විදුලි සංදේශ හා වෙනත් ක්‍රියාකරුවන් විසින්'' යන වචන සහ අංක වෙනුවට ''ක්‍රියාකරුවන් සහ සැපයුම්කරුවන් විසින්'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) “ක්‍රියාකරු” යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය එකතු කිරීමෙන්:-

““සැපයුම්කරු” යන්නට 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලිසංදේශ පනතේ විධිවිධාන යටතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය.”.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපලේඛනය මෙයින් ඇතුළත් කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියට උපලේඛනයක් ඇතුළත් කිරීම

“උපලේඛනය

[2 වන වගන්තිය]

| **I වන තීරුව**<br>**විදුලිසංදේශ සේවා වර්ගය** | **II වන තීරුව**<br>**අනුප්‍රමාණය** |
|---|---|
| 1. 2011 ජනවාරි මස 1 වන දින හෝ ඊට පසුව නමුත් 2013 ජනවාරි මස 1 වන දිනට පෙර ආරම්භ වන කාලසීමාව සඳහා වන විදුලිසංදේශ සේවා; | 20% |
| 2. අන්තර්ජාල සේවා- | |
| (අ) 2013 ජනවාරි මස 1 වන දින හෝ ඊට පසුව නමුත් 2017 සැප්තැම්බර් මස 1 වන දිනට පෙර ආරම්භ වන කාලසීමාව සඳහා; | 10% |
| (ආ) 2017 සැප්තැම්බර් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන කාලසීමාව සඳහා; | 0% |
| 3. අන්තර්ජාල සේවා හැර විදුලිසංදේශ සේවා- | |
| (අ) 2013 ජනවාරි මස 1 වන දින හෝ ඊට පසුව නමුත් 2014 ජනවාරි මස 1 වන දිනට පෙර ආරම්භ වන කාලසීමාව සඳහා; | 20% |

| | |
|---|---|
| (ආ) 2014 ජනවාරි මස 1 වන දින හෝ ඊට පසුව නමුත් 2018 නොවැම්බර් මස 10 වන දිනට පෙර ආරම්භ වන කාලසීමාව සඳහා; | 25% |
| (ඇ) 2018 නොවැම්බර් මස 10 වන දින හෝ ඊට පසුව නමුත් 2019 දෙසැම්බර් මස 1 වන දිනට පෙර ආරම්භ වන කාලසීමාව සඳහා; | 15% |
| (ඇ) 2019 දෙසැම්බර් මස 1 වන දින හෝ ඊට පසුව නමුත් 2022 ජුනි මස 4 වන දිනට පෙර ආරම්භ වන කාලසීමාව සඳහා; | 11.25% |
| (ඉ) 2022 ජුනි මස 4 වන දින හෝ ඊට පසුව ආරම්භ වන කාලසීමාව සඳහා; | 15%.”. |

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**8.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව